# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2240/26 – 2021 අගෝස්තු මස 12 වැනි බ්‍රහස්පතින්දා – 2021.08.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2021 අංක 153 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/11/2014/FH/279.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: BER/4/5/2/64.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය,

2021 මැයි මස 11 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

### උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි** – ප්‍රාදේශීය ලේකම්, බේරුවෙල.

2. **ඉඩමේ විස්තරය** – බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, බේරුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මරදාන ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක KA/BRW/14/625 හි ක්ෂේත්‍ර පොත් ක 5316 හා 2015.02.28 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අංක 01 – ළිඳමුල්ලවත්ත, උඩමුල්ලවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0261**

උතුරට: මරදාන ධීවර වරාය; නැගෙනහිරට: මාර්ගය; දකුණට: කැබලි අංක 2; බටහිරට: මුහුදු වෙරළ.

02. **කැබලි අංක 02 – ළිඳමුල්ලවත්ත, උඩමුල්ලවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0076**

උතුරට: කැබලි අංක 1; නැගෙනහිරට: මාර්ගය; දකුණට: කැබලි අංක 3; බටහිරට: මුහුදු වෙරළ.


1A – G 34834 – 50 (2021/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

03. **කැබලි අංක 03 – ළිඳමුල්ලවත්ත, උඩමුල්ලවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0426**

උතුරට: කැබලි අංක 2; නැගෙනහිරට: මාර්ගය; දකුණට: හිමිකරු නොදන්නා ළිඳමුල්ලවත්ත; බටහිරට: මුහුදු වෙරළ.

08 - 392

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව

**2021 අංක 155 දරන ආඥාව**

මගේ යොමු අංකය: 03J/80/E/794.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 3/3/4/1(දී.ප.අ.3/62/667).

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) යටතේ ආඥාවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට *නැතහොත්*, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම භුක්තියට ගැනීමට මෙයින් නියම කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය,

2021 ජූලි මස 26 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', ,
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි** – ප්‍රාදේශීය ලේකම්, කුලියාපිටිය නැගෙනහිර.

2. **ඉඩමේ විස්තරය** – වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාසයේ, මැද්දෙකැටිය කෝරළේ සුළු කොට්ඨාසයේ, කහටගහමඩ ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද මූ.පි.කු 1340 හා 1986.03.21 දිනැති මූලික පිඹුරේ පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අංක 01 – දංගහමුලවත්ත – ප්‍රමාණය: හෙක්. 0.340**

උතුරට: පාසල් වත්ත මදීනා මහා විද්‍යාලය; නැගෙනහිරට: දංගහමුල්ලවත්ත මස්ජුල් ජලාල් මුස්ලිම් පල්ලි බිම; දකුණට: මකුල්ලගහමුල වත්ත; බටහිරට: කහටගහමඩ ඉහළවැව, මකුල්ලගහමුල වත්ත.

08 - 393

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (ආ) අතුරු විධානය යටතේ ආඥාව

**2021 අංක 156 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/18/2019/WS/525.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 3/2/1/143.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (ආ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම්, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ අනුරූප සටහනේ විස්තරව ඇති පරවශ්‍යතාවයට යටත් වන බව මෙම ආඥාවෙන් ප්‍රකාශයට පත් කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය,

2021 අගෝස්තු මස 06 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', ,
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩමේ විස්තරය.**– බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 125/2, මිනුවන්ගොඩ උතුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, මැඩමුල්ල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක GA/MIN/2020/343 හා 2020.09.04 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

2. **පරවශතාවේ විස්තරය.**– ගම්පහ අත්තනගල්ල සහ මිනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ මිනුවන්ගොඩ වැඩහාර නිලධාරී කාර්යාල ඉඩමට ප්‍රවේශ මාර්ගය ඉදිකිරීමට යෝජිත ඉඩම් කොටසේ පරවශතාව අයිතිය අත්කර ගැනීම.

01. **කැබලි අක්ෂර 'A' – කොන්ගහවත්ත නොහොත් කෝන්ගහවත්තේ කැබැල්ල – ප්‍රමාණය: හෙක්. 0.0254**

උතුරට: ඇළ දිගේ වෙන් කළ බිම සහ කපන ලද කාණුව; නැගෙනහිරට: ඇළ දිගේ වෙන් කළ බිම, කපන ලද කාණුව සහ මාර්ගය (මා.සං.අ.); දකුණට: මාර්ගය (මා.සං.අ.) සහ මෙම ඉඩමේ ඉතිරි කොටස; බටහිරට: මෙම ඉඩමේ ඉතිරි කොටස සහ ප්‍රගමන අනුරේඛන අංක GA/MIN/2020/342.

08 - 394